## බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය.

## නර්තනය - 7 ශ්‍රේණිය

**"උත්සහය" ස්ථායී භාවය හඳුනා ගනිමු**

**නිපුණතා මට්ටම 1.2. භාව ප්‍රකාශ වන පරිදි චරිත නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 1.2. උත්සහය නමැති ස්ථායී භාවය ප්‍රදර්ශනය කරයි.**




- ඉහත සංවාදයෙන් අපට තේරුම් ගත හැකිවනුයේ උත්සහය නැත්නම් උත්සහවන්තකම සෑම සත්වයෙකුම හා බැඳී පවතින ගුණාංගයක් බවයි. ඒ අනුව,

## උත්සහය යනු,

- **“කිසියම් කටයුත්තක්/කාර්යයක් ඉටු කර ගැනීම සඳහා කිසියම් කෙනෙකු විසින් දරන නොපසුබට ධෛර්යයි.”**

- **භරතමුනි පඬිතුමාගේ නාට්‍ය ශාස්ත්‍රය** නමැති ග්‍රන්ථයේ **උත්සහය, ස්ථායි භාවයක්** ලෙසින් දක්වා ඇත. එය ස්ථායී භාවයක් වන්නේ කිසියම් චරිත නිරූපණයක් ඇසුරෙන් එය ප්‍රදර්ශනය කරන අවස්ථාවක දීය.
- කිසියම් චරිත නිරූපණයක් ඇසුරෙන් උත්සහය නමැති ස්ථායී භාවය ප්‍රකාශ වීම මඟින් වීර නමැති රසය උපදින බව භරතමුනි පඬිතුමා පෙන්වා දෙයි.





- ඉහත ඡයාරූප දෙස බලන්න. එම රංගන ශිල්පිනියන් **උත්සහය** නමැති ස්ථායී භාවය නිරූපණය කර ඇති අයුරු පැහැදිලි වේ.
- කිසියම් භාවයක් නිරූපණය කිරීමේ දී එම හැඟීමට **අනුව මුහුණේ මස් පිඬු, ඇස්, ඇසිපිය, කම්මුල්, දෙතොල ආදී උපාංගයන්ගේ ස්වරූපය හැඩ ගැසෙයි.** එය මැනවින් ප්‍රකාශනය වන ලෙස රඟ දැක්වීම රංගන ශිල්පියෙකුගේ දක්ෂතාව ද වෙයි.



2021-06-02

BALANGODA

- දීර්ඝ කාලයක් තිස්සේ කරන ලද **අභ්‍යාසයන්** හේතුවෙන් දක්ෂ නළුවෙකුට හෝ නිළියකට උත්සහය නමැති ස්ථායී භාවය ඕනෑම අවස්ථාවක දී වුව ද ප්‍රදර්ශනය කළ හැකිය.



❋ උත්සහය නමැති ස්ථායී භාවය දැක්වෙන අවස්ථාවක්



## අභ්‍යාස

✓ **පහත සඳහන් සිද්ධීන් අවබෝධ කර, උත්සහය නමැති භාවය නිරූපණය වන ආකාරයේ කතා පුවත් නිර්මාණය කරන්න.(එම කතාවෙහි ඇතුළත් වන චරිත ඇසුරින් උත්සහය නමැති භාවය නිරූපණය විය යුතුය.)**

1) උගුලකට හසු වී සිටින සතෙකු බේරා ගැනීමට දරන උත්සහය.

2) මුව පැටවෙකු සිංහයෙකුගෙන් බේරී පලා යාමට දරන උත්සහය.



2021-06-02

BALANGODA

3) ගසක් මුදුනේ සිරව පවතින සරුංගලයක් පහතට ගැනීමට කරන උත්සහය.

4) ලිදකට වැටී ඇති බලු පැටවෙකු බේරා ගැනීමට කරන උත්සහය.

5) සොර රංචුවකට හසු වී ඉන් බේරී පලා යාමට දරන උත්සහය.

BALANGODA

**සැකසුම :**

**සුමනා මාලනී මිය.( ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, බලංගොඩ.)**

**වයි. වී. පී. කේ. සේනාරත්න මෙය.(ර/බල/කෝංගහමංකඩ විද්‍යාලය. බලංගොඩ.)**